# වර්ෂ 2021 ක්වූ දෙසැම්බර් මස 24 වන දින උඩපලාත ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීමේ වාතර්ාව

වේලාව - පෙරවරු 10.00

❖ පැමිණීම

| | |
|---|---|
| 01.D.Gගුණසේන මහතා | ගරු සභාපතිතුමා |
| 02.L.N අසේල අමරසේන මහතා | ගරු උප සභාපතිතුමා |
| 03.R.M කීතර්ී රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 04.A.ධමර්සිරි අගලවත්ත මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 05..S.A නවරත්න බණ්ඩා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 06 M.G උපචන්ද්‍ර ජයපති මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 07.U.G පාලිත මහින්ද ජිනදාස මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 08.M.G මොහොමඩ් මුරාඩ් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 09.M.G.R පාලිත අබේරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 10. R.M රවින්ද්‍ර දිනුක රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 11.A.C මොහොමඩ් ෆසාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 12. D.W.G හේමකුමාර නයනානන්ද මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 13.W.ප්‍රේමතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 14.A.H.A රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 15. R.M ප්‍රේමරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 16.H.M නීල් සුගත් කුමාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 17.A. සමන්ත කුමාර ආරියදාස මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 18. W.D.G ගුණතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 19.H.M යසස් බණ්ඩාර දෙනුවර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 20.R.G රන්ජන් රාජපක්ෂ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 21. G.A අරුණ ප්‍රසන්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 22.මුතු නීලමේගම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |
| 23.තංගවේලු කාමරාජන් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා |

24.H.G සුසිලාවති මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

25. වත්සලා චතුරාණි සේනානායක මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

26.P.T.G වයලා විනෝදනි චන්ද්‍රපාල මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

27.K.W කෝකිලා කුමාරි වරාහේන මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

28.සෙල්වරාජ් කාතරීකා මෙනෙවිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

29.R චමිලා ෆොන්සේකා මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

30.H.G සුභද්‍රා සමරනායක මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

31. .K සුප්පයියා ජීවා මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

32.පිච්චෙයි සෙල්වපුනේස්වරී මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

33.N.R.M.D නවරත්න රත්නායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

34.ගයානි ශ්‍රියාමාලා ඇතුගල්පේ මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

35.චාමික රුවන් දසනායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

<u>සභාවට නොපැමිණි මන්ත්‍රීවරුන්</u>

36. M.G.W.C.B වේරපිටිය මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

37. D.G ජයන්ත කීතරීසිංහ මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

38.D.M දීසායු මංජුල දිසානායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

39 R.M උදයකුමාර දිසානායක මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

40 D. ප්‍රසන්න මනෝජ් තිලකරත්න මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

41. A ධනුෂ්ක ඉන්ද්‍රජිත් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

42. කුමාරවේලු කනගරත්නම් මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා

43.W. ඩිමෝෂි ඥාණලතා මහත්මිය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමිය

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

පෙරවරු 10.00ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

<u>1.පසුගිය මහසභාවේ සභා වාර්තාව සභා සම්මත කිරිම</u>

පසුගිය නොවැම්බර් මස 25 වන දින මහ සභා වාර්තාව සභා සම්මත කර ගැනීම.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

පසුගිය නොවැම්බර් මස 25 වන දින මහ සභා වාර්තාව සභා සම්මත කරන බව මම යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>

පසුගිය සභා වාර්තාවේ 5(2.8) යටතේ අපද්‍රව්‍ය කළමනාකරණයට රුපියල් ලක්ෂ 20ක මුදලක් වැය කර පුස්සැල්ලාවේ සාදන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කථා කිරිමේදී එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලෙස සභාවේ සියළු දෙනාම පැවසූ බවත් නමුත් එම කරුණු සභා වාර්තාවේ අන්තගර්ත වී නොමැති බවත් තමා සදහන් කලේ පුස්සැල්ලාවේ ඉදිවන කසළ අංගනය ගැන නොව පුස්සැල්ලාව රථගාලක් ඉදිකිරිම ගැන බවත් තමා ස්වාමින් වහන්සේ සමඟ සාකච්ඡා කල බවත් කුණු ගිහින් දමන කාරණය මෙයින් පිළිඹිබු වන නිසා එය ඉවත් කරන ලෙසත් තමාගේ කථාවේදී තමා කථා කලේ මෙම මුදල අපතේ යන නිසා රථගාලක් සාදන ලෙස බවත් එහිදි තමා ප්‍රදේශයේ ජනතාව සහ ස්වාමින් වහන්සේ සමඟ සාකච්ඡා කලේ එම කාරණය සම්බන්ධයෙන් බවත් ඒ නිසා එම කාරණය සංශෝධනය විය යුතු බවත් අපි සභාවේ සියළු දෙනාම මේ මුදල් කසළ කළමනාකරණය සදහා යොදවන ලෙස පැවසූ බවත් සදහන් කරන ලදි.

<u>ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා</u>

පසුගිය සභා වාර්තාවේ 5(1.6) යටතේ ඩයලොග් සිම්පත සම්බන්ධයෙන් කථා කිරිමේදී තමාගේ සිම්පත අවලංගු කරන ලෙසට ලිපියක් ලබාදුන්නේ ඩයලොග් ආයතනයට නොව උඩපළාත ප්‍රාදේශීය සභාවට බවත් එය නිවැරදි විය යුතු බවත් එම කාරණය සංශෝධනය කරන ලෙසත් සදහන් කරමින් පසුගිය නොවැම්බර් මස 25 වන දින මහ සභා වාර්තාව සංශෝධන සහිතව සත්‍ය වාර්තාවක් ලෙස පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු ඒ.එච්.ඒ.රත්නායක මන්ත්‍රීතුමා</u>

ගියවර සභාවට යෝජනා තුනක් තමා ගෙන ආ බවත් එහිදි යෝජනා 2ක් සදහා යම් යම් මන්ත්‍රීවරු විරුද්ධ වු බවත් නමුත් ඒ කිසිවක් සභා වාර්තාවේ සදහන් වී නොමැති බවත් තමාගේ යෝජනාව පමණක් සදහන් වි ඇති බවත් ඒ නිසා එය නිවැරදි කරන ලෙසට ඉල්ලීමක් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

සභාව සතු ළිං ගැන කථා කිරීමේදී වැඩි දෙනෙකු අදහස් දක්වා ඇති නිසා සියළු දේවල් ඇතුළත් කිරිමට අවශ්‍ය නොවන නිසා තමා සියළු අදහස් දැක්වීම් ඇතුළත් නොකර මෙම සභා වාර්තාව කොමසාරිස්තුමාට, විගණනයට යවන නිසා නිවැරදිව සකස් කර යවන ලෙස තමා උපදෙස් දුන් බව සදහන් කරන ලදි.ගියවර සභාවට අපි අයවැය ඉදිරිපත් කල බවත් එහිදි ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමාගේ හැර අනෙකුත් ගරු මන්ත්‍රී මණ්ඩලයේ සහයෝගයෙන් 2022 අයවැය ලේඛනය සභා සම්මත වූ බවත් නමුත් තමා සාම්ප්‍රදායට ගරු කර ඡන්ද විමසීමකට ඉඩ සලසා දුන් බවත් මෙය උඩපළාතේ ජනතාවට සේවය කිරිම වෙනුවෙන් සකස් කල අයවැය ලේඛනය බවත් ඒ අනුව 2022 අයවැය ලේඛනය සියළු දෙනාම බලාපොරොත්තු වන කාරණා ඉටු කරගැනීම සදහා සම්මත කර ගත් බවත් සදහන් කරන ලදි.තවද නොයෙකුත් ආයතන වලින් යම් යම් මන්ත්‍රීවරුන්ට මුදල් ප්‍රතිපාදන ලැබෙන බවත් නමුත් තමා කිසි දිනක කිසියම් හෝ මන්ත්‍රීවරයෙකුට ලැබෙන ප්‍රතිපාදන මුදල් කාගෙන් කොහෙන් ලැබුනේද යන්න නොවිමසන බවත් එය තමාට අදාළ නොවන බවත් තමා සභාපතිවරයා ලෙස සියළු දෙනාට එක සේ සලකන බවත් හිටපු පළාත් සභා මන්ත්‍රීතුමා සභාපති නමින් යෝජනා කිහිපයක් එවා ඇති බවත් එයින් එක් යෝජනාවක් අනෙක අපටත් එවා ඇති බවත් ඒ අනුව කහවත්ත මානුකුලගම මාගර්යට ප්‍රතිපාදන මුදල් ගරු ශාන්ත මන්ත්‍රීතුමාට එවා ඇති බවත් ඩාට්‍රියේ කමරාන්තයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රේමරත්න මහතාට එවා ඇති බවත් ගොනවුවෙල වසමට රු.500000.00 ක ප්‍රතිපාදන මුදලක් එවා ඇති බවත් නමුත් එය තමාද නොදන්නා බවත් තමාට පහර දුන්නත් දොස් පැවරුවත් සියළු දෙනාටම එක හා සමානව සලකන බවත් සභාවේ කායර් මණ්ඩලයටද තමාගේ දරුවන් මෙන් සලකන බවත් ගරු මන්ත්‍රී මණ්ඩලයටද ඉතා ගෞරවයෙන් අමතන බවත් එම නිසා වැරදි අවබෝධ තබාගෙන කටයුතු නොකරන ලෙස ඉල්ලා සිටින

බවත් වසර අවසානයට කොහෙන් හෝ එවන මුදල් තමාට අවශ්‍ය පරිදි බෙදා දෙනවා කියා මන්ත්‍රීවරු සිතන බවත් නමුත් කිසි දිනක තමා එසේ නොකරන බව සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

<u>2. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන</u>

(2)1. ජාතික විගණන කාර්යාලය මඟින් එවා ඇති අංක KDB/E/PS-UP/05/2021/747-I හා 2021 දෙසැම්බර් 06 දරන මූල්‍ය විගණන -2021-පළමු අර්ධ වර්ෂය යටතේ සිදුකරන ලද විගණන පරීක්ෂාවට අදාළ නිරීක්ෂණ සම්බන්ධ නිවේදනය සභාගත කරන ලදි.

(2) 2.ජාතික විගණන කාර්යාලය මඟින් එවා ඇති අංක KDB/E/PS-UP/05/2021/747-II හා 2021 දෙසැම්බර් 06 දරන මූල්‍ය විගණන -2021-පරීක්ෂාව යටතේ සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවට අදාළ නිරීක්ෂණ සම්බන්ධ නිවේදනය සභා ගත කරන ලදි.

(2) 3.උඩපළාත ප්‍රාදේශීය සභාවේ සිව් අවුරුදු සංවර්ධන සැළැස්ම සඳහා ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ යෝජනා ලබා ගැනීම සම්බන්ධ නිවේදනය සභාගත කරන ලදි.

<u>3. සභාව වෙත එවා ඇති සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි සභාවට ඉදිරිපත් කිරිම</u>

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>
**සංදේශ/පෙත්සම්/පැමිණිලි/සන්නිවේදන ලිපි** නොමැති බව සඳහන් කරන ලදි.

<u>4.කල් දී ඇති ප්‍රශ්න</u> - නොමැති බව සඳහන් කරන ලදි.

<u>5.කල් දී ඇති යෝජනා</u>

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05.1 (1)</u>

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

5 (1.1) උඩපළාත ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයට අදාළ අභ්‍යන්තර විගණන වැඩසටහන සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>**

උඩපළාත ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයට අදාළ අභ්‍යන්තර විගණන සැළසුම අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (2)

5 (1.2) උඩපළාත ප්‍රාදේශීය සභාවේ 2022 වෂර්යට අදාළව සකස්කර ඇති පුහුණු සැළැස්ම සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා**

උඩපළාත ප්‍රාදේශීය සභාවේ 2022 වෂර්යට අදාළව සකස්කර ඇති පුහුණු සැළැස්ම පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (3)

5 (1.3) උඩපළාත ප්‍රාදේශීය සභාවේ 2022 වෂර්යට අදාළව සකස්කර ඇති ක්‍රියාත්මක සැළැස්ම සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා**

උඩපළාත ප්‍රාදේශීය සභාවේ 2022 වෂර්යට අදාළව සකස් කර ඉදිරිපත් කර ඇති ක්‍රියාත්මක සැළැස්ම පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (4)

5 (1.4) උඩපළාත ප්‍රාදේශීය සභාවේ 2022 වෂර්යට අදාළව සකස්කර ඇති ප්‍රසම්පාදන සැළැස්ම සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු උපචන්ද්‍ර ජයපති මන්ත්‍රීතුමා**

උඩපළාත ප්‍රාදේශීය සභාවේ 2022 ප්‍රසම්පාදන සැළැස්ම පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (5)

5(1.5)කසළ කළමනාකරණය සඳහා සිමෙන්ති කසළ බඳුන් 119ක් රු.5002.50 බැගින් මිළදී ගෙන ඇත. එම බඳුන් බල ප්‍රදේශයේ ජනතාවට බෙදා දීම සඳහා එම මුදලින් 50% වන රු.2510.00ක මුදලක් අය කර ලබා දීමට මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා

කසළ කළමනාකරණය සඳහා සිමෙන්ති කසළ බඳුන් 119ක් රු.5002.50 බැගින් මිළදී ගෙන ඇති හෙයින් උඩපලාත ප්‍රාදේශීය සභාව මඟින් එම කසළ බඳුන් රු.2510.00ක මුදලකට එනම් සම්පූණර් මුදලින් 50% මුදලකට ලබාදීමට යෝජනා කර ඇති බවත් එම බඳුන් යම් ප්‍රමාණයකට කොම්පෝස්ට් ව්‍යාපෘතියට සහනයක් ලෙස ග්‍රාමීය නිවාස වල ක්‍රියාත්මක කරගැනීම සඳහා වාෂරිකව සභාවෙන් කර ගෙන යන වැඩ පිළිවෙළ සඳහා කසළ බඳුන් ලබාදිය යුතු අත්‍යාවශ්‍යම ප්‍රදේශ වලට දිය යුතු බවත් ඒ අනුව තමාගේ ආඩියාකඩවත ප්‍රදේශය,නාරංවිට ප්‍රදේශය එමෙන්ම දැල්පිටිය ආදී ප්‍රදේශ වලට කසළ බැහැර කිරීම සඳහා ස්ථාන නොමැති නිසා කසළ බඳුන් අත්‍යාවශ්‍ය වී ඇති නිසා එම ප්‍රදේශ වලට ලබාදීම සුදුසු බවත් සඳහන් කරමින් එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු උප සභාපති අසේල අමරසේන මහතා

කසළ බඳුන් ලබා දීමේදි අපට ප්‍රධාන වශයෙන් ගැටළු ඇති වන්නේ පුස්සැල්ලාව ප්‍රදේශයේ නිසා එම ප්‍රදේශයටත් පාරදෙක ප්‍රදේශයටත් කසළ බඳුන් පරිසර නිළධාරිතුමා හරහා ලබාදිය යුතු බවත් මෙම කසළ බඳුන් වලින් කොම්පෝස්ට් සාදා ගත හැකි නිසා පුස්සැල්ලාව ප්‍රදේශයේ ජනතාව දැනුවත් කර පැහැදිලි කිරිමකින් අනතුරුව බෙදාදීම කල යුතු බවත් මෙම කසළ බඳුන් රු.5002.50 මුදලකට සභාව ලබාගත් නමුත් ජනතාවට ලබා දෙන්නේ රු.2510.00ක මුදලකට බැවින් එය ලාභදායී බවත් එනිසා මෙහි පළමු අදියර ලෙස පුස්සැල්ලාව ප්‍රදේශයටත් අනතුරුව පාරදෙක,අටබාගේ,ආඩියාකඩවත ආදි ප්‍රදේශ දක්වා ලබාදිය යුතු බවත් ඒ නිසා විශේෂ දැනුවත් කිරීමක් කණ්ඩායමක් යොදවා පැහැදිලි කිරිමකින් අනතුරුව ලබා දිය යුතු බවත් එවිට 10% පමණ කසළ ගැටළුව විසඳා ගත හැකි බවත් රජය මඟින් යම් යම් විසඳුම් කසළ ගැටළුව විසඳා ගැනීමට යොදවා ඇති බවත් ඒ නිසා මේ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කල යුතු බව සඳහන් කරන ලදි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

කසළ බඳුන් සඳහා රු.2510.00ක මුදලක් ගෙවීමට ජනතාවට අපහසුතා ඇති නිසා මුදල අඩු කර සමාජ සත්කාරයක් ලෙස ලබා දෙන්නේ නම් එය වඩා යෝග්‍ය බවත් තවද පාරවල් පුරා කැළි කසළ දමන බවත් අටබාගේ ඔයට වාහන වලින් පැමිණ කුණු දමන බවත් ඒ නිසා සභාව නමින් පාළම දෙපස කසළ බඳුන් දෙකක් ස්ථානගත කරන ලෙසත් තවද මහර ස්කන්සා බෝඩර් එකට උඩින් මාගර්යට කුණු දමා යන නිසා එවන් ස්ථාන වලද කසළ බඳුන් කිහිපයක් තැබිය යුතු බවත් කසළ නොදමන ලෙස පුවරු ඉදි කලාට එලක් නොවන බවත් සැන්කුවාර් ප්‍රදේශයේද සංචාරකයන් පැමිණ කැළි කසළ ගොඩ ගසා යන නිසා ඒවැනි සංචාරක කලාප වලද සුදුසු ස්ථාන බලා කසළ බඳුන් තැබිය යුතු බවත් තවද ප්‍රසිද්ධ නවාතැන්පළ වල රථවාහන නැවතුම් ස්ථාන වල ප්‍රසිද්ධ ස්ථාන වල කසළ බඳුන් තැබිය යුතු බවත් එවිට අපේ කුණු ට්‍රැක්ටරය දින 2කට වරක් හෝ සතියකට වරක් මෙම කසළ රැගෙන ගියොත් ඉතා වටින බවත් එවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කලොත් කසළ වලින් නිකුත් වන දුගර්න්ධය පවා නැති වන බවත් සඳහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

මෙම කථාව සත්‍ය වුවත් මෙම කසළ බඳුන් දිරන ද්‍රව්‍ය පමණක් දැමීම සඳහා යොදාගන්නා බවත් එලෙස කටයුතු කරනවා නම් අපට කසළ බඳුන් 3ක් දිරන,නොදිරන,කඩදාසි ලෙස තැබීමට සිදු වන බවත් මෙම බඳුන් දිරන කසළ සඳහා පමණක් භාවිතා කල යුතු බවත් ඒ නිසා අපි සාකච්ඡා කර තීරණයක් ගත යුතු බවත් නැත්නම් මෙය විශාල ගැටළුවක් වන බවත් සඳහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (6)

5 (1.6) කොරෝනා වසංගත තත්වය සහ මිල ඉහළ යෑම,ද්‍රව්‍ය වල හිඟතාවය නිසා 2021 වෂර්යේ සභා අරමුදල් ප්‍රතිපාදන යටතේ නිම කිරීමට නොහැකිවූ ව්‍යාපෘති 2022 වෂර්යේ ජනවාරි 31 දින දක්වා කාලය දීඝර් කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු කිතරී රත්නායක මන්ත්‍රීතුමා**

ගරු සභාපතිතුමා ගෙන ආ යෝජනාව තාක්ෂණ නිළධාරි ජයතිලක මහතා තාක්ෂණික කමිටුවේදී ඉදිරිපත් කල බවත් මෙහිදි ද්‍රව්‍ය හිඟය නිසා මෙන්ම කොරෝනා වසංගතය නිසා සමහර මන්ත්‍රීවරුන්ට කමර්ාන්ත ඉටු කිරිමට නොහැකි වු නිසා 2022 ජනවාරි මාසයේ 31 දින දක්වා එම කමර්ාන්ත ඉටු කිරිමට කාලය දීඝර් කිරිමට ගෙන ආ යෝජනාව ද තවද මෙම දිනට කමර්ාන්ත ඉටු කිරිමට නොහැකි වුවහොත් ණයහිමි කිරිමක් සිදු නොකරන බවත් ඒ නිසා සියළු දෙනාම ජනවාරි 31 දිනට ප්‍රථම ගිවිසුම්ගත වූ කමර්ාන්ත පමණක් ඉටු කරන ලෙසට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

2022 ජනවාර් 31 වන දින දක්වා පමණක් මේ සඳහා කාලය ලබා දෙන බව සඳහන් කරන ලදි.

**ගරු ඩබ්.ඩී.ජී.ගුණතිලක මන්ත්‍රීතුමා**

16% කමර්ාන්ත ඉටු කර ඇති බවට මීට පෙර දන්වා තිබූ බවත් තමා ගිවිසුම් අත්සන් කර මාස 6කට වැඩි කාලයක් ගත වී ඇති නමුත් තාක්ෂණ නිළධාරි රණසිංහ මහතා කමර්ාන්ත පරික්ෂාවට නොඑන බවත් තමාද රජයේ සේවකයෙක් බවත් නමුත් සභාවට පැමිණ වාඩි වී සිටින බවත් ඒ නිසා පල්ලේගම කොට්ඨාශයට මින් ඉදිරියට තාක්ෂණ නිළධාරි රණසිංහ මහතා අවශ්‍ය නොවන බවත් මෙහිදි ගරු සභාපතිතුමාට ලේකම්තුමියට කල හැකි දෙයක් නොමැති බවත් ඒ නිසා වෙනත් තාක්ෂණ නිළධාරි මහතෙකු තමාගේ කොට්ඨාශයට ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදි.

**ගරු උප සභාපති අසේල අමරසේන මහතා**

කමර්ාන්ත ඉටු කිරිමට මසකින් කාලය දීඝර් කිරිම ගැන ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වන බවත් මන්ත්‍රීවරුන්ට නොයෙක් ආයතන හරහා ප්‍රතිපාදන මුදල් ලැබී ඇති බවත් නමුත් සිමෙන්ති හා අනෙකුත් ද්‍රව්‍ය වල මිල දිනෙන් දින වධර්නය වන නිසා කොන්ත්‍රාත්කරුවන් කමර්ාන්ත කිරිමට බියක් දක්වන බවත් තමාගේ ප්‍රදේශයේ තාක්ෂණ නිළධාරි ජයතිලක මහතා ඉතා හොඳින් රාජකාරි කටයුතු ඉටු කරන බවත් මන්ත්‍රීවරු බාල්දු වීමට අවශ්‍ය නොවන බවත් යම්කිසි නිළධාරියෙක් එසේ කරනවා නම් එම අයගේ ලිපි ගොනුවට ලිපියක් දමන ලෙසත් එවිට නිළධාරින් හොඳින් කටයුතු කරන බවත් මෙවන් තත්වයන් ගැන

සොයා බැලිය යුතු බවත් තවද කමර්ාන්ත සඳහා මුදල් ලබාගැනිමට සමිති සමාගම් වල අය පැමින අපහසුතාවයට පත් වන බවත් ඒ අනුව පවත්නා දුවර්ලතා ගැන සොයා බලා නිවැරදි කරන ලෙසත් ගරු මන්ත්‍රීවරුන්ට හිමි ගරුත්වය ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

ගරු ගුණතිලක මන්ත්‍රීතුමාගේ අදහස නිවැරදි බවත් නමුත් රජයේ සේවකයින් සම්බන්ධයෙන් අපට උවමනා පරිදි කටයුතු කල නොහැකි බවත් ප්‍රමාද වී ඇති කමර්ාන්ත සියල්ල තාක්ෂණ නිළධාරි ඉන්ද්‍රාණි මහත්මිය හරහා ඉටු කර දෙන බව සඳහන් කරන ලදි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

ලබන වසරේ අපේ මන්ත්‍රීවරු 43 දෙනාම ඉදිරිපත් කරන කමර්ාන්ත යෝජනා එකතු කර එම කමර්ාන්ත යම් කිසි කාල සීමාවක් ලබාදි ඇස්තමේන්තු සකස් කර වැඩ විස්තරය දිග පළල උස සඳහන් කර සැළසුමක් ලබා දිය යුතු බවත් එසේ නොමැතිව ගිවිසුම් අත්සන් කලහොත් නිකරුනේ කාලය වැය වන බවත් එවිට ලබන වසරේ ඇස්තමේන්තු සකස් කරන විට වැඩ විස්තරය නිවැරදිව භාර දිය යුතු බවත් ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත්කරුට භාර දෙන විට සැළැස්මක් ලබාදිය යුතු බවත් ජනවාරි මස ලබා දෙන යෝජනා සඳහා පෙබරවාරි මස ඇස්තමේන්තු දිය යුතු බවත් අප්‍රේල් මාසය වන විට වැඩ අවසන් කර මුදල් ගෙවීමට කටයුතු කල යුතු බවත් නැතිනම් ඒ සඳහා දිනයක් ලබාදිය යුතු බවත් එවිට වැඩ අවසන් කර තත්ව පරීක්ෂණ වාථර්ා දුන් පසු කාලයක් ලබා දී මුදල් ගෙවීමට කටයුතු කල යුතු බවත් සමහර සමිති ගිවිසුම් අත්සන් කර මාස 6,7 සිටින බවත් හැමදාම තාක්ෂණ නිළධාරි මහතුන්ට දොස් පැවරීම නිසා සහෝදරයින් වගේ සිටින නිළධාරි මණ්ඩලය හා මන්ත්‍රී මණ්ඩලය අතර ගැටුම් ඇති වී වෛරක්කාරයින් බවට පත් වන නිසා කාමරීක නිළධාරින්ට කමර්ාන්ත බෙදා දී සැළසුමකට අනුව කටයුතු කිරිමට ලේකම්තුමිය වග බලා ගත යුතු බවත් සඳහන් කරන ලදි.

<u>ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා</u>

මෙම හැමදාම මෙන් කථා කරන මාතෘකාවක් බවත් ගිය වසරේ මන්ත්‍රී ප්‍රතිපාදන රු.700000.00 වු බවත් නමුත් කාමරීක නිළධාරින්ගේ ගැටළුව මෙන්ම අනෙකුත් සමස්ථ වැඩ කටයුතු සම්බන්ධයෙන් ගැටළුවක් පවතින බවත් ඒ නිසා වසරක් තුළ මෙම කමර්ාන්ත ඇස්තමේන්තු කිරිමට නොහැකි වන බවත් පී.ආර්.ඩී ව්‍යාපෘති ගඟ ඉහළ සභාවේ කල බවත් නමුත් අපේ සභාවේ එම කමර්ාන්ත නොකල බවත් අදාළ ආයතන වලින් විමසූ විට යම් යම් කරුණු ඉදිරිපත් කරන බවත් අපේ ගමට ආ ව්‍යාපෘති පවා නොලැබුණු බවත් තමාගේ රු. ලක්ෂ 20ක මුදල නොලැබුණු බවත් එම කමර්ාන්ත වලට ලබා දී ඇති උපදෙස් අනුව ඊළඟ වසරේ කල හැකිද නැද්ද යන්න දැනුම් නොදුන් බවත් සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

ගරු රත්නායක මන්ත්‍රීතුමා කමර්ාන්ත ඉටු කල බවත් අපි ඇස්තමේන්තු සකස් කර යවන ලද නමුත් අනතුරුව වැඩ කටයුතු ඉටු කරන්න අපට දැනුම් නොදුන් නිසා වැඩ ආරම්භ කල නොහැකි බවත් ඒ සම්බන්ධයෙන් උපදෙස් නොලැබුණු නිසා තමාට කල හැකි දෙයක් නොමැති බවත් ගරු නිශ්ශංක මැතිතුමා එවන ලද කමර්ාන්ත 31 වෙනිදාට අවසන් කරන ලෙස පවසා ඇති බවත් අපේ බල ප්‍රදේශය සංවධර්නය කිරිමට තමා කැමති බවත් තමා විරුද්ධ නොවන බවත් නමුත් නීත්‍යානුකූල අවසරයක් නොලැබෙන නිසා කල නොහැකි වු බවත් ජනවාරි මාසයේ සියළුම ගරු මන්ත්‍රී මණ්ඩලය ගිවිසුම් අත්සන් කරන ලෙසත් ඉල්ලා සිටින ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (7)

5 (1.7) 2022 වෂර්යේ මහ සභා රැස්වීම් පැවැත්වීමට නියමිත පහත සදහන් දිනයන් සදහා මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

| | | | | | |
|---|---|---|---|---|---|
| ජනවාරි | 20 | පෙබරවාරි | 18 | මාතර්‍ු | 18 |
| අප්‍රේල් | 08 | මැයි | 19 | ජූනි | 23 |
| ජූලි | 24 | අගෝස්තු | 18 | සැප්තැම්බර් | 22 |
| ඔක්තෝබර් | 20 | නොවැම්බර් | 17 | දෙසැම්බර් | 15 |

ගරු කිතරී රත්නායක මන්ත්‍රීතුමා

මෙහිදි සියළු දින නොව කිහිපයක් වෙනස් විය හැකි බවත් 2022 වසරේ මහ සභාව පැවැත්වීමට නියමිත දිනයන් පිළිබඳ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

හදිසි යෝජනා

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

තීරණ අංක 05.1 (8)

5 (1.8) කොවිඩ් එන්නත්කරණ කටයුතු සදහා රු.ලක්ෂ 15ක මුදලක් මහ සභාවේ අනුමත කර ඇතිමුත් ඉදිරියේදී බූස්ටර් එන්නත ලබාදීමේ සුහසාධක වියදම් ලෙස තවත් රු.350000.00 ක ප්‍රතිපාදන මුදලක් ඇතුළුව රු.1850000.00 වැය කිරිමට මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු අගලවත්ත මන්ත්‍රීතුමා

රු.1500000.00 මුදලට නැවත රු.350000.00 ක මුදලක් එකතු කර එන්නත්කරණ කටයුතු සදහා රු.1850000.00 ක මුදලක් වැය කිරිම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

තවද දොළුව ප්‍රාදේශීය සංවධර්න කමිටු රැස්වීමේදී අපේ සභාව විසින් කරනු ලබන කායර්යන් සියල්ල ඇගයීමට ලක් වූ බවත් නමුත් අවසානයේ ඉතිරි වන කසළ ටික එකතු නොකරන බවට චෝදනාවක් ඉදිරිපත් වූ බවත් ඒ ගැන අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිටින ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>තීරණ අංක 05.1 (9)</u>

5 (1.9)ප්‍රාදේශීය සභාව මගින් පවත්වා ගෙන යන නිල්ලඹ, හල්ඔය, වාරියගල,වටගොඩ, දොළුව, කායර්ල හංදිය, ගුරුකැලේ සහ රාජමලේ යන ජල යෝජනා ක්‍රම වලින් නව ජල සම්බන්ධතා ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති හෙයින් නව ජල සැපයුම් ඉල්ලුම් කරන අයට සැපයුම අක්‍රිය කර ඇති අයගේ නම වෙනුවට නම සංශෝධනය කර හිඟ මුදල් අය කර නව ගිවිසුමක් යටතේ ජල සැපයුම් ලබාදීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා</u>

නව ගිවිසුමක් යටතේ එම හිඟ මුදල් අය කර ගෙන ජල සම්බන්ධතා ලබාදීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

<u>තීරණ අංක 05.2 (1)</u>

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමාගේ යෝජනා</u>

5 (2.1)තෝරාගත් ප්‍රදේශ වලට සූයර් බල වීජී පහන් සවිකිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පුස්සැල්ලාව නගරයේ දැඩි විදුලි පහන් අබර්දයක් පවතින බවත් වීජී පහන් 30ක් පමණ සවි කර තිබුනත් දැනට බල්බ් 4ක් පමණක් ක්‍රියාත්මක වන බවත් ඒ නිසා සූයර්බල විදුලි පහන් කණු ටිකක් පුස්සැල්ලාව නගරයට ස්ථාපනය කලොත් වඩා යෝග්‍ය බවත් එසේම දොළුව නගරය,කහවත්ත,පුපුරුස්ස,මිල්ලගහමුල,පන්විලතැන්න වැනි අපේ ප්‍රාදේශීය සභාවෙන් මෙම ස්ථාන වලටද සූයර් බල විදුලි පහන් සවි කිරිම සුදුසු බවටද යෝජනා කරමි.

එසේම සෑම මන්ත්‍රීවරයෙකුම තම තමන්ගේ අභිමතය පරිදි තමන්ගේ කොට්ඨාශයට රු.50000.00, රු.60000.00 වැය කර එක් සූයර්බල විදුලි පහනක් හෝ සවි කර ගතහොත් ඉතා වටිනා බවත් එවිට සෑම ගමකටම එළියදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර විදුලි පහන් අබර්දයට විසදුමක් සැලසෙන වැඩපිළිවෙළක් සකස් කිරිම සුදුසු බවට යෝජනා කරමි.

<u>ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා</u>

ජාතික ප්‍රතිපත්තියක් අනුව පුනජර්නනීය බලශක්ති ප්‍රවධර්නය කිරිම අතිගරු ජනාධිපතිතුමාගේ ඉලක්කය බවත් රජයේ වැඩපිළිවෙළ වන්නේ රටේ පවතින බලශක්ති අබර්දයට විසදුමක් ලෙස සූයර් සහ සුළං බලාගාර වැඩි කර ගෙන යන බවත් අපට පවතින ගැටළුව වන්නේ මුදල් බවත් එක් විදුලි පහනක් සදහා රු.50000.00ක මුදලක් වැය වන බවත් මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ මෙම කටයුත්ත ඉටුකිරිම හොද බවත් නමුත් ප්‍රායෝගික ගැටළු නිසා නඩත්තු කිරිම අසීරු කටයුත්තක් බවත් ටෙන්ඩර් දමා පැනල් පවිත්‍ර කිරිම කල යුතු බවත් මෙම විදුලි පහනක් වසර 20ක් පමණ කාලයක් පවතින බවත් විදුලි බිලක් අය නොවන නිසා සභාවට ලාභදායී බවත් ඒ නිසා වසරට එක බැගින් හෝ සූයර්බල විදුලි පහන් ස්ථාපනය කල යුත බවත් සදහන් කරමින් එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

තීරණ අංක 05.2 (2)

**ගරු දිනුක රත්නායක මන්ත්‍රීතුමාගේ යෝජනා**

05.2 (2)වැවතැන්න පාසල අසළ මංසන්ධියේ තාවකාලිකව පවත්වා ගෙන යන ත්‍රීරෝද රථ 5ක් පමණ ගාල් කල හැකි රථගාල උඩපළාත ප්‍රාදේශීය සභාව යටතේ ලියාපදිංචි ත්‍රීරෝද රථගාලක් වශයෙන් පවත්වාගෙන යාම සුදුසු බවට මම යෝජනා කරමි.

දැනට වැවතැන්න පාසලට පහළින් මංසන්ධියේ කුඩා ඉඩ ප්‍රමාණයක ත්‍රීරෝද රථ 5-6 පමණ ගාල් කර තරුණයින් පිරිසක් කටයුතු කරගෙන යන බවත් එම ස්ථානයේ අවිධිමත්භාවයක් පවතින නිසා ගැටළු පැන නැගුන බවත් ඒ නිසා සභාවක් ලෙස සභාවට ආදායමක් ලැබෙන වැඩ පිළිවෙළක් ලෙස මෙම ස්ථානයේ අපේ සභාවේ උදව්වෙන් අවශ්‍ය භූමිය සකස් කර දී තරුණයන්ට කරන උපකාරයක් ලෙස ත්‍රීරෝද රථ ගාලක් පවත්වා ගෙන යාමට අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙස සදහන් කරන ලදි.

**ගරු උප සභාපති අසේල අමරසේන මහතා**

මෙම ස්ථානයේ ත්‍රීරෝද රථ 5-6 පමණ ගාල් කර ඇති බවත් ඒ නිසා සභාවට ආදායමක් ලැබෙන පරිදි මදක් පුළුල් කොට භූමිය සකස් කල යුතු බවත් මීට ඉහතදී යම් යම් මන්ත්‍රීවරු නැවතුම් ස්ථාන ගැසට් කර තිබූ නිසා සභාවට රු.500000.00ක පමණ ආදායමක් ලැබෙන බවත් ඒ අනුව කුඩා ප්‍රමාණයෙන් හෝ සභාවට ආදායම් සොයා දීම යුතුකමක් බවත් එම යෝජනාව ගැන ස්තූතිවන්ත වෙමින් යෝජනාවට අදාළ කාර්යන් වෙනුවෙන් උදව් උපකාර සභාව මඟින් සලසා දිය යුතු බවත් දන්වමින් මෙම යෝජනාව මම ස්ථිර කරමි.

**ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා**

දැනට අපේ තිබෙන රථ ගාල් වල එක් අයෙක් දෙන්නෙක් වෙනත් කිසිම අයෙකුට ධාවනය කරන්න අවස්ථාව නොදෙන බවත් ඒනිසා සභාව අනුමත කල ත්‍රීරෝද රථ සංඛ්‍යාවට අමතරව ධාවනය සදහා අළුත් අයෙකුට අවස්ථාව ලබා දීමේ බලය ගරු සභාපතිතුමාට තිබෙන බව සදහන් කරන ලදි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

තීරණ අංක 05.2 (3)

**ගරු උප සභාපති අසේල අමරසේන මහතාගේ යෝජනා**

05.2 (3)අංක 171/6 කීරපනේ ගම්පොල ලිපිනයෙහි පදිංචි රාසයියා පාකියලෙච්චමී මහත්මිය සතු පර්චස් 4.14 සහිත ඉඩමේ ඉදි කරන ගොඩනැගිල්ල සදහා ගොඩනැගිලි අයදුම්පත්‍රය අනුමත කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

ගරු උප සභාපතිතුමා ඉදිරිපත් කල යෝජනාව තමාට නීත්‍යානුකූලව ඉඩ ලබාදිය නොහැකි බව දන්වා සිටි බවත් නමුත් මහ සභාවේ තීරණය දැනගැනීම පිණිස ඉදිරිපත් කර ඇති බවත් ප්ලෑන අනුමත කරගන්න

පැමිණි නමුත් තමා පැවසුවේ තමාට අවසර දිය නොහැකි බවත් දෙනවා නම් සීමාවන්ට යටත්ව කුඩා නිවසක් ඉදි කිරිමට අවසර දිය හැකි බවත් නමුත් කුඩා ප්‍රමාණයක් නිසා දිගින් දිගට මෙය කල නොහැකි බවත් සඳහන් කරන ලදි.

**<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>**

මෙම අය ස්වාමි පුරුෂයා අහිමි වී ඉතා දුෂ්කර ජීවිතයක් ගත කර ඉඩම් කැබැල්ල රැගෙන ඇති බවත් මෙම යෝජනාව තමා සභාවට ගෙන ආ බවත් උඩපළාතේ පුස්සැල්ලාව වහුගපිටිය වැනි ප්‍රදේශ වලද මෙවැනි ප්‍රශ්න පවතින බවත් එම අයටද පර්චස් 4ක ඉඩම් කැබැල්ලක් තිබෙන අයෙකුටද තිබෙන ගැටළුව මෙය බවත් මෙම කාන්තාව මෙතැනින් එහාට කිසිම දෙයක් කරගත නොහැකි බවත් ඒ නිසා සභාවේ නීති වල තිබෙන ගරු සභාපතිතුමාට දී ඇති බලය මත මෙම අයට වෙනත් ඉඩම් නොමැති නම් ග්‍රාම නිළධාරි හා ප්‍රාදේශීය ලේකම් කායර්ාල හරහා ඔප්පු කර එම ගොඩනැගිල්ල අනුමත කල හැකි බවත් දිවුරුම් ප්‍රකාශයකින් ලබා දී මේ දේවල් කල හැකි බවත් කුඹුරක් ගොඩ කරලා නම් අනුමත කල නොහැකි බවත් බල ප්‍රදේශයේ ගොඩාක් අය බැංකු ණය ලබා ගැනීමට උවමනා නිසා නීත්‍යානුකූලව සැළසුම් අනුමත කරගන්න යන විට ප්‍රශ්න මතු වන බවත් එම අයට පිළිසරණක් නොමැති බවත් ගොඩවෙළ ප්‍රදේශයේ කාන්තාවක් තම පුත්‍රයාට විදුලි බල මණ්ඩලයේ සේවය කරන බැවින් රු.ලක්ෂ 50ක ණය මුදලක් ලබා දීමට බැංකුව අනුමත කල නිසා ගොඩනැගිල්ල ඉදි කිරිමේ අනුමැතිය ලබාගැනීමට සභාවට පැමිණි විට සභාවේ නිති රීති වලට යටත්ව එම අයට අනුමැතිය ලබාදීමට නොහැකි බව දන්වා ඇති බවත් නමුත් අපි මහජන නියෝජිතයින් වශයෙන් ජනතාවගේ ගැටළු විසදා දීමට වගකීමෙන් කටයුතු කල යුතු බවත් මෙහි වංචාවක් සොරකමක් නැත්නම් කෙසේ හෝ අනුමත කර දිය හැකි බවත් සානුකම්පිතව සිතා මෙය අනුමත කල හැකි බවත් ඒ නිසා සොයා බලා අනුමත කර දෙන ලෙස සඳහන් කරන ලදි.

**<u>ගරු කිතරී රත්නායක මන්ත්‍රීතුමා</u>**

වෙනත් ඉඩම් මෙම අයට නොමැතිදැයි සොයා බලා ගරු සභාපතිතුමාගේ විධායක බලතල අනුව ඉල්ලුම්කරු ගැන සානුකම්පිතව සලකා බලා අනුමැතිය දිය හැකි බව පෙන්වා දී ඇති නිසා මෙම අසරණ තැනැත්තියට අවශ්‍ය ගොඩනැඟිලි අයදුම්පතට අනුමැතිය ලබා දෙන ලෙසට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

**<u>ගරු  අගලවත්ත මන්ත්‍රීතුමා</u>**

අහිංසක පුද්ගලයෙක් ලෙස නම් අනුමැතිය දිය හැකි බවත් නමුත් ලිපියේ ලෙසට අහිංසක නොවන බවත් රු. ලක්ෂ 50ක ණයක් ගැනීමට යන බවත් ඒ අනුව බැලූ කල මෙම ඉඩම අනුමත කර ගෙන කාට හෝ විකුණන්නට යන බවක් පෙනෙන නිසා මේ සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂාවක් කර අවශ්‍ය කටයුතු කිරීම සුදුසු බවද තවද එකවරම මේ සම්බන්ධයෙන් කටයුතු නොකර සදසිරිවත්තේ රජයේ ඉඩම් ද තිබෙන නිසා තව දුරටත් පරීක්ෂා කර බලා අනතුරුව මේ සම්බන්ධයෙන් කටයුතු කරමු යැයි මම යෝජනා කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

අපේ තාක්ෂණ නිළධාරි සහ තවත් මන්ත්‍රීවරු කිහිප දෙනෙක් සහභාගී වී පරීක්ෂා කර බලා ඉන් අනතුරුව අවසර ලබා දෙන බව සඳහන් කරන ලදි.

**<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>**

තමාද පවසන්නේ තාක්ෂණ නිළධාරිතුමා යොදා ගෙන පරීක්ෂා කර බලා කිසි ගැටළුවක් නොමැති නම් අනුමත කර දෙන ලෙස බව පවසන ලදි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

මීට පෙර කිහිප වතාවකදී මෙවන් කටයුතු වලට අවසර දී ඇති බවත් නමුත් සොයා බලා කටයුතු කල යුතු බවත් මෙවන් යෝජනා ඉදිරිපත් කරන විට න්‍යාය පත්‍රයට යොමු කර ඉදිරිපත් කලා නම් අපට බැලීමට හැකියාව තිබූ බවත් එසේ නොමැතිව එකවර සභාවට ඉදිරිපත් කරන විට මේ සඳහා අවස්ථාවක් ලබාදිය නොහැකි බවත් සඳහන් කරන ලදි.

<u>තීරණ අංක 05.2 (4)</u>

<u>ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමාගේ යෝජනා</u>

05.2 (4)**වත්තේහේන** ජල ව්‍යාපෘතියේ ප්‍රධාන ජල නළය සහා අරමුදලින් සකස් කිරිමට මහ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරමි.

තමා ගිය සභාවේද මෙම යෝජනාව ගෙන ආ බවත් ගරු අගලවත්ත මන්ත්‍රීතුමා ස්ථිර කල බවත් පවුල් 1000කට පමණ ජලය ලබා දෙන ප්‍රධාන ජල නළය කැඩී ඇති නිසා ගිය සභාවේද සකස් කිරිමට අනුමැතිය ලබා දුන්නත් තවම ජල නළය අළුත්වැඩියා නොකල බවත් මෙහිදි මන්ත්‍රීවරයෙක් සම්බන්ධ බව සඳහන් නමුත් එය මේ සඳහා සම්බන්ධ කරගැනීමේ අවශ්‍යතාවයක් නොමැති බවත් කැඩුණු වතුර ලයින් එක සකස් කල යුතු බවත් අදාළ මන්ත්‍රීවරයා ගෙවනවාද නැද්ද යන්න ඉදිරියට ඇති ගැටළුවක් බවත් නැතිනම් දැල්පිටිය ප්‍රදේශයට ජලය නොමැති වන බවත් ඒ නිසා සභා අරමුදලින් මුදල් යොදවා ජල නළය අළුත්වැඩියා කරන ලෙස සඳහන් කරන ලදි.

තවද 2019 වසරේ මෙම සභාවේ යෝජනා ස්ථිර කර තිබූ දැල්පිටිය සම්බෝධි විහාරයට ජලය සැපයීම අද වන තුරු ඉටු වි නොමැති බව සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

ජල නළය සකස් කරන්න බඩු ගන්න හැකියාවක් නොමැති බවත් සියළු දෙනා බට කඩා සාදන්න කියුවොත් තමා කුමක් කරන්නද යන්නත් අවශ්‍ය බඩු නොමැති බවත් සඳහන් කරන ලදි.

<u>ගරු අගලවත්ත මන්ත්‍රීතුමා</u>

අපේ සභාවේ මුදලක් යොදවා මෙම ජල නළය සකස් කර ඉන් අනතුරුව කඩන ලද අයගෙන් මුදල අය කර ගනිමු යැයිද සඳහන් කරමින් එම යෝජනාව මම ස්ථිර කරමි.

එසේම අපේ ජල යෝජනා ක්‍රමයෙන් වත්තේහේන බෝධිරුක්ඛාරාම විහාරයටත් ඇස්කොට් විහාරයටත් සම්බෝධි විහාරයටත් පල්ලියටත් නොමිලේ ජල සැපයුම ලබා දෙමු යැයි මම යෝජනා කරමි.

<u>ගරු කිතරී රත්නායක මන්ත්‍රීතුමා</u>

ජල බිල්,විදුලි බිල් අය කරන විට පූජනීය ස්ථාන වලට යම්කිසි සහන සීමාවක් තිබෙන බවත් ඒ අනුව ජල බිල්පත් සකස් කරන ලෙසට ඉල්ලා සිටින බවත් එසේ නොමැතිව නොමිලේම ජලය ලබාදීම කල නොහැකි බවත් එවිට වටිනාකමක් නොමැති බවත් සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

තමා ජලය ලබාදෙන බවත් නමුත් බිල්පත් ගෙවන ලෙස දැනුවත් කරන ලෙසට ඉල්ලා සිටින ලදි.

<u>ගරු යසස් දෙනුවර මන්ත්‍රීතුමා</u>

දැල්පිටිය විහාරස්ථානයේ ජල බිල්පත තමා ගෙවන බව සඳහන් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

<u>තීරණ අංක 05.2 (5)</u>

<u>ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමාගේ යෝජනා</u>

05.2 (5)ඉල්ලගොල්ල වාරියගල මාගර්යේ ජල සම්පාදන මණ්ඩලයේ සංවධර්න කටයුතු නිසා ජනතාව අපහසුතාවයට පත්වීම පිළිබඳව එම ආයතනය දැනුවත් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

මෙම මාගර්ය සම්බන්ධයෙන් තමා දීසර් ලෙස කථා කල බවත් ඉල්ලගොල්ල මාගර්ය ජල සම්පාදන මණ්ඩලයෙන් 1KM පමණ කපා ඇති බවත් දැනට වසරක පමණ කාලයක් ගත වී ඇති බවත් මේ සඳහා සභාවේ මුදල් තැන්පත් කර ඇති නමුත් මාගර්ය සංවධර්නය නොකරන බවත් ඒ නිසා ජනතාවගේ ගෙවල් වල බැම් කැඩී නිවාස වලට හානි වී ඇති බවත් ඉල්ලගොල්ල මාගර්ය වෂර්ාවට දොළුව පාර දක්වා සෝදාගෙන ගොස් ඇති බවත් ඒ නිසා ජල සම්පාදන මණ්ඩලය දැනුවත් කර මාගර්ය සංවධර්නය කිරීම නිවැරදිව ඉටු නොකලොත් තබා ඇති තැන්පතු මුදල නොදෙන බව දන්වා යැවිය යුතු බවත් දන්වා ඉතා ඉක්මනින් ඉල්ලගොල්ල මාගර්යේ අළුත්වැඩියාව සිදු කර දෙන ලෙසට ජල සම්පාදන මණ්ඩලය දැනුවත් කරන ලෙසට සඳහන් කරන ලදි.

<u>ගරු උප සභාපති අසේල අමරසේන මහතා</u>

මෙම මාගර්ය දිවංගත හිටපු අගමැතිතුමා හැදූ මාගර්යක් බවත් එතුමාට පිං සිදුවන්නට ජනතාව ගමන් කරන බවත් කවුරුන් හෝ යමක් කලා නම් එය අගය කල යුතු බවත් නමුත් මෙම මාගර්ය ජල සම්පාදන මණ්ඩලය හිතූ හිතූ ලෙස කඩා දමන බවත් ගම්පොල ජල සම්පාදන මණ්ඩලයෙන්ද මෙලෙස මාගර් ජල නළ එළීම පිණිස කඩා බිද දමන බවත් සභාවට මුදල් ගෙවූ බව ඔවුන් පවසන බවත් ඉල්ලගොල්ල මාගර්ය සෑදීමට ගරු පාලිත අබේරත්න මන්ත්‍රීතුමා මහන්සි බවත් මෙම මාගර්ය යථා පරිදි තිබුණු ආකාරයටම ඉතා කඩිනමින් සංවධර්නය කර දෙන ලෙසට උඩපළාත ප්‍රාදේශීය සභාවේ ඉල්ලීමක් ලෙස ජල සම්පාදන ඇමතිතුමාට,ගැටඹේ කායර්ාලයට,ගම්පොල කායර්ාලයට ලිපි යොමු කරන ලෙස සඳහන් කරමින් එම යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

තමා සියළුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉතා ගෞරවණීය ඉල්ලීමක් කරන බවත් මින් ඉදිරියට සභාපතිවරයා ලෙස තමා කිසිම හදිසි යෝජනාවක් මහ සභාවට ඉදිරිපත් නොකරන බවත් එසේම මන්ත්‍රී මණ්ඩලයේ කිසි අයෙකු එලෙස හදිසි යෝජනා ඉදිරිපත් නොකරන ලෙසත් තරයේ දන්වා සිටින බවත් මන්ද යත් එයින් සභාවේ ප්‍රශ්න මෙන්ම මන්ත්‍රී මණ්ඩලය අතර භේද ඇති වන බවත් ඒ නිසා ඉදිරියේදි න්‍යාය පත්‍රයේ යෝජනා පමණක්ම ඉදිරිපත් කරන බවට මහ සභාව දැනුවත් කරන ලදි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සඳහන් කරමි.*

<u>**කමර්ාන්ත යෝජනා**</u>

<u>**ගරු සභාපති ඩී.ජී.ගුණසේන මැතිතුමාගේ යෝජනා**</u>

5 (2.2)පුස්සැල්ලාව පොදු වෙළඳපොළ පිටුපස කොටසේ බැම්ම ඉදිකිරීම රු.40000.00 යොදාගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>**ගරු මොහොමඩ් මුරාඩ් මන්ත්‍රීතුමාගේ යෝජනා**</u>

5 (2.3)උනම්බුව හුණුගලවත්ත 60/4/ඒ දෙණිය ක්‍රිෂ්ණකුමාර් මයාගේ නිවස අසළ මාගර්යේ පැතිබැම්මෙහි පඩිපෙළ සංවධර්නය කිරීම රු.350000.00 කමර්ාන්තය වෙනුවට සංශෝධන කමර්ාන්ත ලෙස,

1)ගම්පොල ඉලංගවත්ත 178 ඉක්බාර් මයාගේ නිවස අසළ මාගර්ය කොන්ක්‍රීට් කිරීම රු.200000.00

2)ඉලංගවත්ත 2 අංක 251/ජේ රිෆ්කාන් මයාගේ නිවස අසළ කාණුව සකස් කිරිම රු.150000.00 යොදාගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>**ගරු අගලවත්ත මන්ත්‍රීතුමා**</u>

ඉදිරිපත් කර ඇති කමර්ාන්ත යෝජනාව සහ සංශෝධිත කමර්ාන්ත යෝජනා ඉටුකිරීම සුදුසු බවට ගෙන ආ යෝජනා මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

<u>**(6) කාරක සභා වාථර්ා ඉදිරිපත් කිරීම**</u>

1.2021.11.25 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාථර්ාවසහ 2021.12.07 දිනැති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාථර්ාඉදිරිපත් කිරීම

2.2021.11.26දිනැති පරිසර කමිටු වාථර්ාව ඉදිරිපත් කිරීම

3.2021.12.13දිනැති කමර්ාන්ත කමිටු වාථර්ාව ඉදිරිපත් කිරීම

4. 2021.12.21 දින ටෙන්ඩර් කමිටු වාථර්ාව ඉදිරිපත් කිරීම

ඉදිරිපත් කර ඇති සියළුම කමිටු වාථර්ා පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

<u>**ගරු කිතරී රත්නායක මන්ත්‍රීතුමා**</u>

සියළුම කමිටු වාථර්ා පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මම සදහන් කරමි.*

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

**(7) ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීම** -2021නොවැම්බර් මස ආදායම් වියදම් වාර්තාව හා ආදායම් ප්‍රගති වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදි.

**උඩපළාත ප්‍රාදේශීය සභාව**
**ආදායම් වියදම් වාර්තාව - 2021 නොවැම්බර්**

| | ආදායම් | | | | වියදම් | |
|---|---|---|---|---|---|---|
| **10** | <u>වරිපනම් හා බදු</u> | | | 1 | වැටුප් හා දීමනා | 4,515,145.93 |
| I | වරිපනම් හා බදු | 96,739.07 | | | | |
| II | අක්කර බදු | 12,300.50 | | 2 | ගමන් වියදම් | 75,189.00 |
| III | ජල ගාස්තු | 99,585.50 | | | | |
| IV | ව්‍යාපාර බදු | 36,950.00 | 245,575.07 | 3 | සැපයුම් හා උපකරණ | 287,682.00 |
| **20** | <u>කුළී</u> | | | | | |
| I | ගෙවල් කුළී | 3,875.00 | | 4 | ප්‍රාග්ධන වත්කම් | |
| II | වෙළඳ අයිතිය බදු දීම | 345,612.43 | | | අළුත්වැඩියාව හා | 47,513.00 |
| III | පොදු වැසිකිළිය | - | | | නඩත්තුව | |
| iv | බදු මුදල් | - | | | | |
| v | කුලියට දීම | | 349,487.43 | | | |
| **30** | <u>බලපත්‍ර ගාස්තු</u> | | | | | |
| I | වෙළඳ බලපත්‍ර වෙළඳ | 152,998.00 | | 5 | ප්‍රවාහන සම්බන්ධතා හා | 318,954.50 |
| II | බලපත්‍ර ත්‍රිරෝද | 16,800.00 | 169,798.00 | | අවශ්‍යක සේවා | |
| **40** | <u>සේවා සඳහා ගාස්තු</u> | | | | | |
| I | ලී.ප. සහතික හා පරීක්ෂණ ගාස්තු | 144,827.58 | | 6 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | 8,378.58 |
| II | අය කර ගත හැකි ගාස්තු | 215,969.42 | 360,797.00 | | | |
| **50** | <u>වරෙන්තු ගාස්තු හා දඩ</u> | | | 7 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 160,314.80 |
| I | දඩ මුදල් | 10,029.94 | 16,735.66 | | | |
| 2 | වරෙන්තු ගාස්තු | 6,705.72 | | | | |
| **60** | <u>වෙනත් ආදායම්</u> | | | | | |
| I | පොලී | | | 8 | විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ පාරිතෝෂික | - |
| II | විකුණුම් | 357,449.00 | | | | |
| III | මුද්දර ගාස්තු | 9,531,790.00 | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| IV | සේවක ණය පොළී | 51,981.28 | 9,941,220.28 | | | |
| **70** | වෙනත් ආධාර | | | 9 | ප්‍රාග්ධන වැය | 2,770,551.82 |
| I | පරිපාලන ප්‍රතිපූර්ණ | 3,988,931.37 | | | | |
| II | සාමුහික ආධාර | | 3,988,931.37 | | | |
| **80** | මුලධන ලැබීම් | | | | අත්තිකාරම් ගෙවීම | 132,932.00 |
| I | මුලධන ආධාර | | - | | සේවක ණය | 126,319.00 |
| | සේවක ණය | | 256,924.00 | | ණයහිමි ගෙවීම් | 1,060,265.36 |
| | තැන්පත් | | 419,923.59 | | තැන්පත් | 333,983.78 |
| | කර්මාන්ත ණයගැති ලැබීම් | | | | අතිරික්තය | 5,965,894.63 |
| | අත්තිකාරම් පියවීම | | 53,732.00 | | | |
| | | | **15,803,124.40** | | | **15,803,124.40** |

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

2021 නොවැම්බර් මස ආදායම් වියදම් වාර්තාව හා ආදායම් ප්‍රගති වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

*ගරු ශාන්ත නවරත්න මන්ත්‍රීතුමා*

2021 නොවැම්බර් මස ආදායම් වියදම් වාර්තාව ඉදිරිපත් කර ඇති බවත් ඒ අනුව සමස්ථ ආදායම රු.15,803,124.40 වන බවත් මෙහි විශේෂයෙන් මේ දක්වා ආදායම වර්ධනය වීමට හේතුව වී ඇත්තේ රු.9,531,790.00 ක මුදලක් මුද්දර ගාස්තු ලෙස ලැබී ඇති නිසා බවත් තවද පරිපාලන ප්‍රතිපූර්ණ ලෙස රු.3,988,931.37 ආදී වශයෙන් වෙනදා වගේම සාමාන්‍ය පරිදි ආදායම ලැබී ඇති බවත් පසුගිය මාස වල කථා කල පරිදි මුද්දර ගාස්තු හා පරිපාලන ප්‍රතිපූර්ණ අඩු කල පසු සමස්ථ ආදායම ලැබී ඇති ආකාරය පැහැදිලි වන බවත් වියදම් පැත්ත බැලූ කල ප්‍රාග්ධන වත්කම් ලෙස රු.47,513.00ක මුදලක් ගෙවා ඇති බවත් අත්තිකාරම් ගෙවීම් ලෙස රු.132,932.00 මුදලක්ද ණයහිමි ගෙවීම් ලෙස රු.1,060,265.36ක මුදලක්ද ආදී වශයෙන් එම මාසය තුළ ලක්ෂ 37ක් ඉක්ම වූ මුදල් ප්‍රතිපාදන සඳහා වෙන් වී ඇති බවත් කෙසේ වෙතත් එම මාසයේ අතිරික්තයක් ලෙස රු.5,965,894.63ක මුදලක් පෙන්වන බවත් ආදායම් වියදම් ලේඛනය අනුව ගණන් හිලව් සම්බන්ධයෙන් අපි සතුටු වූ බවත් නමුත් මුද්දර ගාස්තු හා පරිපාලන ප්‍රතිපූර්ණ නිසා එලෙස සිදු වී ඇති බවත් සඳහන් කරමින් 2021 නොවැම්බර් මස ආදායම් වියදම් වාර්තාව හා ආදායම් ප්‍රගති වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වන බව මහ සභාව තීරණය කරන ලදී.*

ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා

අද දින සභාවට නොපැමිණි ගරු ***මන්ත්‍රීතුම***න්ලාගේ සහ ***මන්ත්‍රීතු***මියන්ලාගේ නිවාඩු අනුමැතිය සඳහා සභාවට යොමු කරන ලදී.

*<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>*

අද දින මාසික මහ සභාවට නොපැමිණි සියළුම මන්ත්‍රීතුමන්ලාගේ මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිමසුදුසු බවට මම යෝජනා කරමි



<u>ගරු මුරාඩ් මන්ත්‍රීතුමා</u>

අද දින මාසික මහ සභාවට සහභාගි නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරිමසුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

*ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සහා සම්මත වන බව* මහ සභාව *තීරණය කරන ලදි.*

**(8) වෙනත්**

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

ගරු ජයන්ත කීතරිසිංහ මන්ත්‍රීතුමාගේ ලොකු තාත්තා අභාවප්‍රාප්ත වී ඇති බවත් තමා රෝහලය ගිය අවස්ථාවේ අද දින සවස 14.00 ට අවසන් කටයුතු සිදු කරන බව පැවසු බවත් සදහන් කරමින් ඒ සදහා සහභාගී වන ලෙස ගරු මන්ත්‍රී මණ්ඩලයෙන් ඉල්ලා සිටින ලදි.

*<u>ගරු කීතරී රත්නායක මන්ත්‍රීතුමා</u>*

ලබන්නා වූ නව වසර ගරු සභාපතිතුමා ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමිය ඇතුළු කායර් මණ්ඩලයටත් සුභ නව වසරක් වේවා යි සුභ පැතුම් ගෙන එන ලදි.

**(9) ඉදිරි මහ සභා දිනය තීරණය කිරීම-**

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

ඉදිරි මහ සභා දිනය පවත්නා තත්වය මත තීරණය කරන බව සදහන් කරන ලදි.

**(10) මහ සභාව අවසන් කිරීම**

**(10) මහ සභාව අවසන් කිරීම**

<u>ගරු සභාපති ඩී.ජී ගුණසේන මහතා</u>

අද දින එනම් 2021 වෂර්යේ අවසන් මහ සභා වාරය සදහා සහභාගී වූ ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමිය ඇතුළු කායර් මණ්ඩලයටත් ස්තුතිවන්ත වන අතර යම් යම් දේවල් වලට අපි ගැටුම් ඇති කර ගත්තත් අපි සභාවෙන් පිටතදී සහෝදරත්වයෙන් කටයුතු කරන බවත් වසර 3 ½ පමණ කාලයක් ගෙවී අවසන් වි ඇති බවත් සදහන් කරමින් ලබන්නා වූ 2022 වෂර්ය සුභදායි වසරක් වේවායි සියළු දෙනාට ප්‍රාථර්නා කරන අතර අපට කල නොහැකි වූ කාරණා සම්බන්ධයෙන් 2022 වසරේ ඉතා හොදින් කටයුතු කිරිමට ගරු මන්ත්‍රී මණ්ඩලයත් ලේකම්තුමිය ඇතුළු කායර් මණ්ඩලයත් අධිෂ්ඨාන කරගමු යැයි සදහන් කරමින් සියළු දෙනාට තෙරුවන් සරණ ප්‍රාථර්නා කරමින් ප.ව.12.30ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදි.

ලේකම්

උඩපළාත ප්‍රාදේශීය සභාව

සභාපති

උඩපළාත ප්‍රාදේශීය සභාව